**සමුපකාර සංවර්ධන අරමුදල - 2016**

**-----------------------------------------------**

සමුපකාර සංවර්ධන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.350,000 ක්වූ ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමූපකාර සමිති ණය සම්බන්ධව පවත්වා ගෙන යනු ලබන පොදු ලෙජරයේ සමූපකාර සමිති අක්‍රීය ණය ශේෂය රු.23,027,197 ක්වූ අතර ඒ සඳහා වූ කේවල ණය ලේඛනයේ අක්‍රීය ණය ශේෂ එකතුව රු.47,255,334 ක් විය. ඒ අනුව රු.24,228,137 ක වෙනස සම්බන්ධයෙන් අදාල ණය ලේඛනය නිවැරදි කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී එම වෙනස ණය ලෙජරයට හා සමුච්චිත අරමුදලට ගලපා තිබීම හේතුවෙන් සමූපකාර සමිති ණය හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. ගැලපීම් කරන ලද අක්‍රීය ණය ශේෂය මත 2016 වර්ෂයේදී රු.6,057,071 ක අඩමාණ ණය වෙන් කිරීම් ගලපා තිබීම හේතුවෙන් අඩමාණ ණය ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සීමාසහිත බන්ධනාගාර දෙපාර්තමේන්තු අන්‍යාධාර අර්ථසාධක අරමුදල් සමූපකාර සමිතියේ 2011 හා 2012 වර්ෂයට අදාලව රු.117,766 ක් වූ දායක මුදල් සහ සීමාසහිත ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමයේ 2013 හා 2014 වර්ෂයට අදාල රු.233,630 ක් වූ දායක මුදල් වෙන් කිරීම් සමාලෝචිත වර්ෂයේදී දෙවරක් සටහන් කිරීම නිසා ලැබිය යුතු දායක මුදල් හා අතිරික්තය රු.351,396 කින් වැඩියෙන් දැක්වුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොදු ලෙජරයට අනුව ලැබිය යුතු සමූපකාර සමිති ණය පොලී ගිණුම හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පොලී ලේඛනය අතර රු.599,213 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට දායක මුදල් ලෙජරය හා දායක මුදල් ලේඛනය අතර, සමුපකාර සමිති 13 කින් ලැබිය යුතු දායක මුදල් ශේෂයේ රු.206,095 ක වෙනසක් පැවතුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු වසර 19 ක කාලයක සිට පැවත එන රු.2,666,000 ක් වූ සමුපකාර විදුහල් ණය, වසර 8 ක කාලයක සිට පැවත එන රු.1,999,600 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.1,184,000 ක් වූ උසාවි වන්දි මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කරගෙන නොතිබුණි.

(ආ) සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතියට 2012 වර්ෂයේදී ලබා දී තිබුණු රු.3,000,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අයවී නොතිබුණි.මාසික ණය වාරිකය රු.55,556 ක් බැගින් වාරික 54 කින් ණය ගෙවා නිම කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.2,983,090 ක ණය ශේෂයක් හා හිඟ හිටි පොළිය රු.883,260 ක් වූ අතර, මෙම මුදල් අයකර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමුපකාර සමිති 59 කින් අයවිය යුතු රු.31,392,901 ක් වූ ණය ශේෂය අවුරුදු 15 ත් අවුරුදු 53 ත් අතර කාල පරාසයක සිට අයනොවී පැවති අතර එම අක්‍රිය ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී අය වී තිබුණේ එක් සමිතියකින් රු.70,000 ක් පමණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට සමිති 36 කින් ලැබිය යුතු දායක මුදල රු.52,042,838 ක් වූ අතර ඉන් රු.24,904,119 ක් එනම් සියයට 48 ක් සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිතියෙන් 2006 වර්ෂයට පෙර සිට අයවිය යුතුව පවතින ශේෂයක් බව නිරීක්ෂණය විය .

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 188 (2) | 2011 හා 2012 වර්ෂයන්ට අදාළ එකතුව රු.300,000 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් 2017 අගෝස්තු 31 දින වන විටත් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 4.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 4.2 ඡේදය | අරමුදලේ බැංකු ගිණුම සහ පොත්පත් නිතිපතා සසඳා ප්‍රගතිය පිළිබඳව එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 4.3 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,701,425 ක අතිරික්තයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,458,554 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,242,871 කින් වර්ධනය වී තිබුණි. වෙනත් වියදම් රු.7,528,624 කින් වැඩි වුවද දායක මුදල් ආදායම් රු.4,528,052 කින්, විවිධ ආදායම් රු.3,390,254 කින් හා ආයෝජන පොලී ආදායම් රු.1,548,403 කින් වැඩි වීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී ඌනතාවයක් පැවති අතර 2012, 2013, 2015 හා 2016 වර්ෂයන්හිදී මූල්‍ය අතිරික්තයක් පැවතුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු.21,962,534 ක් වූ දායකත්වය 2016 වර්ෂය වනවිට රු.11,053,628 ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද සමූපකාර රීතීන්හි 43 වගන්තිය ප්‍රකාර සමූපකාර අරමුදලෙහි මුදල් යෙදවිය හැකි ආකාර පහත පරිදි වේ.

- සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ
- සමූපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම
- සමූපකාර සමිතිවලට උපකාර කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ කාර්යයක් ලෙස ණය/ප්‍රදාන ලබාදීම දක්වා තිබුණ ද 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කිසිදු මුදලක් ණය/ප්‍රදාන වශයෙන් ලබා දී නොතිබුණි. ණය අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාපරිපාටි හඳුනා නොගැනීම නිසා ණය නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බව සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් පිළිතුරු වශයෙන් දක්වා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව ජාතික සමූපකාර සමිති/සංගම් මඟින් අයවිය යුතු දායක මුදල් රැස්කිරීම යටතේ සමිති 31 කින් මුදල් රැස්කිරීමට ඉලක්ක කර තිබුණද, 2016 වර්ෂයේදී රැස් කරගෙන තිබුණේ සමිති 8 කින් රු.4,869,469 ක් පමණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

2010, 2011 හා 2012 සිට පැවත එන එකතුව රු. 141,522 ක් වූ හඳුනා නොගත් බැංකු තැන්පතු 05 ක් 2017 අගෝස්තු 31 දින වන විටත් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | උපයෝගී පොත් යාවත්කාලීන කිරීමේ ප්‍රමාදයක් පැවතීම. |
| (ආ) ණය අයකර ගැනීම | සමූපකාර සමිතිවලින් ණය අයකර ගැනීමේ ප්‍රමාදයක් පැවතීම හා පසුවිපරම් කටයුතු නිසි පරිදි සිදු නොවීම. |
| (ඇ) දායක මුදල් අයකර ගැනීම | සමිති විගණනය හා සමුපකාර සමිතිවලින් දායක මුදල් අයකර ගැනීමේ ප්‍රමාදයක් පැවතීම. |